# බෞද්ධ කැරලිකාරිත්වය ශ්‍රී ලංකාවේ නැවත හිස ඔසවයි

ශ්‍රී ලංකාවේ සිංහල බෞද්ධ කැරලිකරුවන් විසින් මුස්ලිම්වරුන්ට විරුද්ධව කරන පහරදීම් හදිසියේ පැන නැගීම නිසා අලුත් ජාතිවාදී ප්‍රචණ්ඩතා වටයක් පිළිබඳ බියක් මතුවී තිබේ. ජාත්‍යන්තර ක්‍රයිසිස් කණ්ඩායමේ ජ්‍යෙෂ්ඨ ශ්‍රී ලංකා විශ්ලේෂක ඇලන් කීනන් මේ ප්‍රශ්නෝත්තර මාලාවේදී පවසන්නේ ප්‍රචණ්ඩත්වය හිතුමතේ මුදා හැරීම වලක්වා ලීම සඳහා රජය වෛරී භාෂණයට එරෙහි නීති ක්‍රියාවේ යොදවා ප්‍රචණ්ඩත්වය සංවිධානය කිරීමට සම්බන්ධ වූවන් අත් අඩංගුවට ගෙන නඩු පැවරිය යුතු බවයි.

---

**මධ්‍යම පළාතේ මහනුවර දිස්ත්‍රික්කයේ බෞද්ධයන් සහ මුස්ලිම්වරුන් අතර ගැටුම් හටගෙන දිනකට පසු, ජාතිවාදී ප්‍රචණ්ඩත්වය මැඩලීම සඳහා දින දහයක හදිසි නීති තත්වයක් බල පවත්වන බව ශ්‍රී ලංකා රජයේ ප්‍රකාශකයෙක් අඟහරුවාදා ප්‍රකාශ කළේය. රටේ මේ මෑතම ජාතිවාදී ප්‍රචණ්ඩත්වය ට හේතු මොනවාද?**

ශ්‍රී ලංකාවේ මුස්ලිම්වරුන්ට එරෙහිව මෑතදී පැන නැගුනු ප්‍රචණ්ඩත්වයට හේතු ගණනාවක්ම තිබේ. පසුගිය දවස් දහයේ සිදුවූයේ බෞද්ධයන් හා මුස්ලිම්වරුන් අතර ප්‍රාදේශීය "ගැටුම්" නොවේ. ඒවා තම අරමුණු සම්ප්‍රදායික සහ සමාජ මාධ්‍ය ඔස්සේ මැනවින් ප්‍රසිද්ධියට පත් කර තිබෙන, හොඳින් දැන හඳුනාගත් ජාතික මට්ටමේ සටන්කාමී කණ්ඩායම් විසින් දියත් කරන ලද සංවිධිත හා ඉලක්කගත ප්‍රහාරයි. ළඟදීම හටගත් ප්‍රචණ්ඩතා චක්‍රය ආරම්භ වුනේ මධ්‍යම කඳුකරයේ තෙල්දෙණිය නගරයේ සිංහල බෞද්ධයෙක් මාර්තු 3 වැනිදා මිය යාමත් සමගයි. එයින් දින දහයකට පෙර ප්‍රදේශයේ මුස්ලිම් මිනිසුන් හතර දෙනකු විසින් ඔහුට පහර දී තිබේ. ඔවුන් වහාම අත් අඩංගුවට ගෙන රඳවාගෙන ඇත. ඔහුගේ මරණය සමග කෝපයට පත් ප්‍රදේශවාසී බෞද්ධයන් පිරිසක් පසුදින සීමිත ප්‍රචණ්ඩත්වයක යෙදීම නිසා 24 දෙනකු පොලිසිය විසින් අත්අඩංගුවට ගෙන රඳවා තබා ගන්නා ලදී. ඔවුන් නිදහස් කරන ලෙස ඉල්ලමින් රැඩිකල් බෞද්ධ කණ්ඩායම් වල නායකයෝ වෙනත් දිස්ත්‍රික්ක වල තමන්ගේ ආධාර කරුවන්ද සිය ගණනින් නගරයට රැස් කර ගෙන, පසුව මුස්ලිම් දේවස්ථාන, ව්‍යාපාරික ස්ථාන සහ නිවාස වලට පහර දෙන්නට පටන් ගත්හ. හදිසි නීතිය ඊයේ ප්‍රකාශ කිරීමෙන් පසුවත්, මහනුවර නගරය අවට කඳුකරයේ මුස්ලිම්වරුන්ට විරුද්ධව ප්‍රචණ්ඩතා දියත් වෙමින් පවතී.

මේ සතියේ මෙම ප්‍රහාරය දියත් වුනේ ගිනිකොනදිග නගරයක් වන අම්පාරේ මුස්ලිම් පල්ලියකට සහ වෙළෙඳ ව්‍යාපාර වලට පහරදී දින කීපයකට පසුය. ඒ ප්‍රහාරය සැලසුම් කොට දියත් කරනු ලැබුවේ වැඩි වශයෙන්ම සමාජ මාධ්‍ය ඔස්සේ ප්‍රචාරය කරන ලද කටකතා වල ආධාරයෙන් අම්පාර නගරයට පිටින් ගෙන්වන ලද බෞද්ධ සටන්කාමීන් විසින් බවට ඇඟවීම් තිබේ. පොලිසියේ මන්දගාමී ප්‍රතිචාරය නිසා හානිය වඩාත් බරපතල වූ බව ආණ්ඩුවේ නිලධාරීන් විසින් පිළිගෙන ඇත.

දිගින් දිගටම සිදුවන ප්‍රචණ්ඩත්වයෙන් පෙන්නුම් කරන්නේ මහින්ද රාජපක්ෂගේ ආණ්ඩුවේ සහායෙන් 2012-2014 කාලයේ මුලින්ම මතුවූ කැරලිකාර බෞද්ධ කණ්ඩායම් නැවත ඉස්මතු වීමයි. වර්තමාන සහාග ආණ්ඩුවේ පළමු අවුරුදු දෙක තුල යටපත් වූ මුස්ලිම් වරුන්ට එරෙහි ප්‍රහාර 2017 අප්‍රේල් සහ මැයි අතර සති හයක කාලයකටත් 2017 නොවම්බරයේ දවස් දෙකකටත් නැවත ආරම්භ විය. රාජපක්ෂ තන්ත්‍රය යටතේ ප්‍රචණ්ඩත්වය සහ වෛරී භාෂණය

යොදා ගැනීම සම්බන්ධයෙන් වගකිවයුත්තන්ට එරෙහිව නීතිය ක්‍රියාත්මක කිරීමට ආණ්ඩුව අසමත් වීම නිසා කැරලිකාරීන් නිර්භීත වීම ඊට හේතුව ලෙස පෙනී යයි.

**සිංහලයන් හා දමිළයන් අතර ආතතිය නිසා ශ්‍රී ලංකාව අතීතයේ ජාත්‍යන්තර ජනමාධ්‍ය සිරස්තල අතරට පැමිණ තිබුනි. එහෙත්, බෞද්ධයන් සහ මුස්ලිමුන් අතර සබඳතා ඔබ විස්තර කරන්නේ කොයි ආකාරයටද?**

ශ්‍රී ලංකාවේ ජනගහනයෙන් සියයට දහයක් පමණ වන මුස්ලිම්වරු රටේ හැමතැනම සිංහලයන් අතරත් (ජනගහනයෙන් සියයට 75 ක් සහ ඉතා විශාල ප්‍රමාණයක් බෞද්ධ) දමිළයන් අතරත් (සියයට පහළොවක් පමණ වන බහුතරය හින්දු) ජීවත් වෙති. ශ්‍රී ලංකාවේ මුස්ලිම්වරුන් සහ අනිත් ප්‍රජාවන් අතර සම්බන්ධතාවය බොහෝ දුරට සාමකාමීයි. ඒ අතරම, දිවයිනේ සිංහල බෞද්ධ ස්වභාවයට තර්ජනයක් එල්ලවී ඇතැයි බියක් කාලාන්තරයක් තිස්සේ බොහෝ සිංහලයන් අතර මුල්බැස තිබෙන අතර, ප්‍රචණ්ඩත්වය යොදා හෝ එය ආරක්ෂා කරගත යුතුයැයි විශ්වාස කෙරේ. ඒ තර්ජනය පැමිණෙන්නේ යටත් විජිත පාලකයන්ගෙන් සහ දමිළයන්ගෙන් යයි කලින් විශ්වාස කෙරුනු අතර බොහෝ සිංහලයන්ට දැන් ප්‍රධාන ප්‍රශ්නය වී ඇත්තේ මුස්ලිමුන්ය. ගෝලීය ඉස්ලාම් භීතිකා වාගාලංකාර වලින් පෝෂණය වුනු අනාරක්ෂාව පිලිබඳ ආඛ්‍යාන මගින් මුස්ලිම්වරුන් දක්වනු ලබන්නේ, ප්‍රචණ්ඩ අන්තවාදී, සිංහල බෞද්ධ බහුතර තත්වයට තර්ජනයක් වන තරමට වේගයෙන් ජනගහනය වැඩිකරගන්නා, සිංහලයන් දුර්වල කිරීම සඳහා සිය ආර්ථික බලය අයථා ලෙස යොදාගන්නා සහ  සිංහල බෞද්ධ ජන සංඛ්‍යාව අඩු කිරීම සඳහා සිංහලයන් කන කෑම සහ අඳින ඇඳුම් වලට වඳ බෙහෙත් හොරෙන් රිංගවන පිරිසක් ලෙසයි. මේ භීතිකා සහ මිත්‍යා සමාජ මාධ්‍ය ඔස්සේ පුළුල් ලෙස ප්‍රචාරය කෙරෙන්නේ ප්‍රචණ්ඩත්වය සඳහා කෙරෙන කැඳවීම්ද සමගය.

මේ භීතිකා ඇතැම් සිංහල ව්‍යාපාරික කොටස් විසින්ද නිරන්තරයෙන් දිරිගන්වනු ලබන්නේ තමන්ගේ මුස්ලිම් තරගකරුවන් දුර්වල කිරීම සඳහාය. මේ පසමිතුරු කම් ප්‍රාදේශීය මට්ටමින් ප්‍රකාශයට පත්වන්නේ මුස්ලිම් කඩ වර්ජනය කරන ලෙස සිංහල බෞද්ධ පාරිභෝගිකයන්ට නිතර කරන ඉල්ලීම් සහ මුස්ලිම්වරුන් සතු ව්‍යාපාර වලට එරෙහිව නිතිපතා ගසන කැරලි හරහාය. එය ජාතික මට්ටමේ ස්වභාවයක් ගන්නේ ඇතැම් ප්‍රධාන සිංහල ව්‍යාපාරිකයන්ගේ දායකත්වයෙන් පවත්වාගෙන යන බවට පුළුල් ලෙස විශ්වාස කෙරෙන බොදු බල සේනා සහ වෙනත් සටන්කාමී කණ්ඩායම් ඔස්සේය. විශේෂයෙන්ම ග්‍රාමීය මට්ටමේත් සහ කුඩා නගර වලත් ජීවන වියදම පාලනය කරන්නට සහ චිරස්ථායී ජීවිකාවක්  සලසා දෙන්නට ආණ්ඩුව පොරබදන අවස්ථාවක, මුස්ලිම්වරුන් අසාධාරණ ලෙස වැඩි ආර්ථික බලයක් අත්කරගන්නේය යන කතාව ආර්ථික දුෂ්කරතා වලට මුහුණ දී සිටින සිංහලයන් අතරේ හොඳින් ප්‍රතිරාවය වන්නකි.

**ශ්‍රී ලංකාවේ මුස්ලිම්වරුන් ප්‍රචණ්ඩතාව කරා ආදී යාමට තිබෙන ඉඩකඩ කවරේද?**

දැනට අවුරුදු පහක් තිස්සේ පවත්වාගෙන යනු ලබන දරුණු, දිග්ගැසුනු සහ බොහෝවිට ප්‍රචණ්ඩ පීඩනය හමුවේ ශ්‍රී ලංකාවේ මුස්ලිම්වරුන් හික්මීමෙන්, සංයමයෙන් සහ අහිංසාවාදයෙන් ප්‍රතිචාර දක්වා ඇති ආකාරය ප්‍රශංසනීයය. දිගටම ප්‍රචණ්ඩ ඇවිස්සීම් තිබියදීත් අපට බලාපොරොත්තු විය හැක්කේ  මෙය ඒ ආකාරයෙන්ම පවතීවා කියා පමණයි. පොලිසිය මුස්ලිම්වරුන් ආරක්ෂා කිරීමට අසමත් වීම නිසා ඔවුන්ගේ ඉවසීමේ සීමාව ඉක්මවා ගිය බවක් පෙනෙන්නේ සිංහල ව්‍යාපාර වලට විරුද්ධ පළමු ප්‍රතිප්‍රහාරය වාර්තා වීම සමගයි. වර්තමාන බෞද්ධ ප්‍රහාර රැල්ලේ  සැලසුමක් වන්නේ මුස්ලිම්වරුන්ගෙන්ද ප්‍රචණ්ඩ ප්‍රතිචාරයක් අවුස්සා

ගැනීම මගින් එම ප්‍රජාවට එරෙහි පුළුල් ප්‍රහාරයක් යුක්ති සහගත කිරීම යැයි ශ්‍රී ලංකාවේ බොහෝ දෙනා බිය පල කරති.

**බෞද්ධයන් හා මුස්ලිම්වරුන් අතර ආතතිය සමනය කොට වාර්ගික සමගිය නගා සිටුවීම සඳහා ශ්‍රී ලංකාවේ ආණ්ඩුව උත්සාහ කර ඇත්තේ කෙසේද?**

ප්‍රජාවන් දෙක අතර පවතින අවිශ්වාසය සහ අනවබෝධය සම්බන්ධයෙන් පියවර ගැනීමට හෝ ප්‍රචණ්ඩතාව වෙනුවෙන් ප්‍රචාරක කටයුතු කරන නැතහොත් ප්‍රචණ්ඩතාව යොදා ගන්නා බෞද්ධයන් සුළු  පිරිස බැඳ තැබීමට හෝ ආණ්ඩුව පියවර ගෙන නැත. මුස්ලිම් වරුන්ට පහර දුන්නවුන්ගේ දණ්ඩ මුක්තිය අවසන් කරන්නට පොරොන්දුවී 2015 ජනවාරියේ බලයට පත් වුනත්, අතීත ප්‍රචණ්ඩත්වය සම්බන්ධයෙන් ආණ්ඩුව කිසිදු හරියාකාර විමර්ශනයක් පවත්වා නැති අතර මුස්ලිම්වරුන්ට එරෙහි ප්‍රහාර වලට සම්බන්ධ බවට හඳුනාගෙන තිබෙන කණ්ඩායම් වල කිසිදු නායකයකුට විරුද්ධව නීතිය ක්‍රියාත්මක කර නැත. ප්‍රචණ්ඩ ක්‍රියා වල නිරත වන්නන් සම්බන්ධයෙන් නීතිය තදින් ක්‍රියාත්මක කොට අත් අඩංගුවට ගන්නා බවට ජනාධිපති, අගමැති සහ වෙනත් බලධාරීන් ප්‍රකාශ කළත් සිදුවෙමින් පවතින ප්‍රචණ්ඩත්වයේ ප්‍රධාන සංවිධායකයන් ස්සිටින්නේ නිදැල්ලේය. ස්ථාන ගණනාවකම පොලිසිය කැරලිකරුවන්ගේ පැත්ත ගත් බවට විශ්වසනීය ලෙස චෝදනා නැගී තිබේ.

ආණ්ඩුවේ ප්‍රධානීන් මුස්ලිම් විරෝධී ප්‍රචණ්ඩත්වයට සහාය දෙන බවට පිළිගැනීමක් නැතත්, මුස්ලිම්වරුන්ට උදව් කිරීම නිසා සිංහල බෞද්ධ ඡන්දදායකයන් ගෙන් කොන් වනු ඇතැයි බියෙන්, විශේෂයෙන්ම මීට සම්බන්ධ බවට විශ්වාස කෙරෙන බෞද්ධ භික්ෂූන් ඇතුළු අපරාධකරුවන්ට විරුද්ධව පියවර ගැනීමට බියෙන් සිටින බව පෙනී යයි. හිටපු ජනාධිපති රාජපක්ෂගේ නායකත්වයෙන් සිංහල බෞද්ධ ජාතිකවාදී පදනමක තදින් මුල් බැසගත් සාර්ථක මැතිවරණ ව්‍යාපාරයක් දියත්වූ පෙබරවාරි 10 මැතිවරණයෙන් ආණ්ඩුව දුර්වල ප්‍රතිපලයක් ලබා ගැනීමත් සමග මේ බිය තවත් වැඩිවී තිබේ. ජනාධිපතිවරයා සමග තම රස්සාව රැක ගැනීමේ අරගලයක නිරතවී සිටින අගමැතිවරයා අතර එන්න එන්නම වැඩිවන බේදය නිසා ආණ්ඩුව තවත් අකර්මණ්‍ය වී ඇති බවක් දිස්වෙයි.

**තව දුරටත් ජාතිවාදී ප්‍රචණ්ඩ ක්‍රියා ඇතිවීම වැලැක්වීමට ආණ්ඩුව ගත යුතු පියවර හෝ ඊට කළ හැකි දේ හෝ කුමක්ද?**

වෛරී භාෂණයට විරුද්ධවීමද ඇතුළුව නීතිය ක්‍රියාත්මක කිරීමෙන් හා වරදකරුවන් අත් අඩංගුවට ගෙන නඩු පැවරීමෙන් පටන්ගෙන, ආණ්ඩුව තුන් වැදෑරුම් උපාය මාර්ගයක් අනුගමනය කළ යුතුය. මාර්තු හයවැනිදා ආණ්ඩුව විසින් හදිසි නීතිය ප්‍රකාශයට පත් කිරීම නිසා ප්‍රචණ්ඩත්වය අඩුවී ගිය බවක් මුලින් පෙනී ගියත් පොලිසිය හා හමුදාව බොහෝවිට කැරලිකරුවන් වැලැක්වීමේ නොහැකියාවක් පාන අතර ප්‍රහාර නැවත ආරම්භ වී තිබේ. ප්‍රචණ්ඩත්වය සහ වෛරී භාෂණය පසුපස සිටින ප්‍රධාන පුද්ගලයන් අත් අඩංගුවට ගැනීමට වහාම ක්‍රියාත්මක වී ආණ්ඩුව එහි අවශ්‍යතාව බෞද්ධ ආගමික නායකත්වයට සහ පොදු මහජනයාට පැහැදිලි කළොත්, එම ප්‍රතිපත්ති සඳහා සහාය ලබා ගැනීමේ ඉඩක් පවතී. මධ්‍ය හා දීර්ඝ කාලීන වශයෙන් ආණ්ඩුව කළ යුත්තේ බෞද්ධ පාරිභෝගිකයන් වඳ කොට ඔවුන්ගේ ජනගණනය අඩු කිරීම සඳහා මුස්ලිම් ආපනශාලා ආහාරවලට නිරන්තරයෙන් වඳ පෙති දමන බවට විශේෂයෙන්ම සමාජ මාධ්‍ය හරහා කරන චෝදනා වැනි සටන්කාමී බෞද්ධ කණ්ඩායම් විසින් මුස්ලිම්වරුන් සම්බන්ධයෙන් පතුරුවන බොරු හා දූර්මත නිවැරදි කිරීමට ක්‍රියාකාරීව කටයුතු කිරීමයි. ඒවාට විරුද්ධව සටන් කිරීම සඳහා ආණ්ඩුව තම මාධ්‍ය හා තොරතුරු මාර්ග යොදා ගන්නේ නම්, එවැනි කටකතා සහ ''ව්‍යාජ පුවත්'' වල බලපෑම සැලකිය යුතු අයුරින් අඩු

කර ගත හැකිය. අවසාන වශයෙන් දීර්ඝ කාලීනව ගත් කල, රටේ සුවිශේෂ සිංහල බෞද්ධ සංස්කෘතිය සුරකින අතරේ, මෙය  සියලු ප්‍රජාවන්ට සමසේ අයිති රටක්ය යන බහුත්වවාදී ශ්‍රී ලංකාවක් පිලිබඳ දැක්ම වඩාත් ක්‍රියාකාරීව නගා සිටුවිය යුතුය.

**ඉදිරි සති කීපය තුල ආරක්ෂාව සහ ජාතීන් අතර තත්වය පරිනාමය වන ආකාරය ඔබට පෙනෙන්නේ කොහොමද? තත්වය පාලනය කර ගැනීමට ශ්‍රී ලංකාවේ ආණ්ඩුවට හැකියාවක් ලැබේද?**

හොඳින් දන්නා හඳුනන බෞද්ධ උද්ඝෝෂකයන් සහ වර්තමාන ප්‍රහාර අවුළුවන්නන් අත් අඩංගුවට ගැනීමට දිගින් දිගටම අසමත් වීම විශ්වාසය ඇතිකරන්නක් නොවේ. හදිසි නීතිය පනවා තිබුනත් ප්‍රචණ්ඩත්වයට ප්‍රතිචාර දක්වන්නේ කෙසේද යන්න සම්බන්ධයෙන් ආණ්ඩුව තවමත් අතීරණයක ඉන්නා බවක් පෙනීයයි. පළාත් පාලන ඡන්දයේ පරාජය සමග ආණ්ඩුව තුල ඇතිවී තිබෙන ව්‍යාකූලත්වය සහ අභ්‍යන්තර ගැටුම දිගටම ඇදී යමින් දුර්වලතාවක් විදහා දැක්වීමට දායක වී තිබෙන අතර එය කැරලිකාර බෞද්ධ කණ්ඩායම් තමන්ගේ වාසියට හරවාගෙන තිබේ. බෙලහීන කරවන සුළු අලුත් ජාතිවාදී ගැටුමකට ශ්‍රී ලංකාව ඇද වැටීම වලක්වා ගන්නට නම් දැඩි, ස්ථිරසාර හා පැහැදිලි පියවර ගත යුතුව තිබේ.

මේ ප්‍රශ්නෝත්තර මාලාවේ උපුටනයක් ඩොයිෂ වෙලර් ජර්මන් ගුවන් විදුලිය විසින්ද ප්‍රචාරය කෙරිනි.